සැබැවින්ම මිනිසෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ, ඇතැම් කරුණු පිළිබඳ කතා කළේය. එවිට ඔහු: 'අල්ලාහ් සහ ඔබ අභිමත කළ පරිදි සිදු විය' යැයි පැවසීය. එවිට එතුමාණෝ ‘අල්ලාහ්ට ආදේශයක් බවට නුඹ මා පත් කළෙහි ද? මාෂා අල්ලාහ් (අල්ලාහ්ගේ අභිමතය පරිදි) යනුවෙන් පමණක් පවසනු.' යැයි පැවසුහ

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. සැබැවින්ම
මිනිසෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ, ඇතැම් කරුණු පිළිබඳ
කතා කළේය. එවිට ඔහු: 'අල්ලාහ් සහ ඔබ අභිමත කළ පරිදි සිදු විය' යැයි පැවසීය. එවිට එතුමාණෝ ‘අල්ලාහ්ට ආදේශයක් බවට නුඹ මා පත් කළෙහි ද? මාෂා අල්ලාහ් (අල්ලාහ්ගේ අභිමතය පරිදි) යනුවෙන් පමණක් පවසනු.' යැයි පැවසුහ. [إسناده حسن] [رواه ابن ماجه والنسائي في الكبرى وأحمد]

මිනිසෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ, ඇතැම් කරුණු පිළිබඳ කතා කළේය. පසු ව ඔහු: 'අල්ලාහ් සහ ඔබ අභිමත කළ පරිදි සිදු විය' යැයි පැවසීය. එම ප්රකාශය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ හෙළා දැක, අල්ලාහ්ගේ අභිමතය මැවීම්වල අභිමතය හා 'වාව්' (සහ) යන නිපාත පදය යොදා සම්බන්ධ කිරීම කුඩා ෂිර්ක් ගණයට අයත් කරුණක් බව දන්වා සිටියහ. එලෙස මුස්ලිම්වරයකු ප්රකාශ කිරීම සුදුසු වන්නේ නැත. පසුව "මා ෂා අල්ලාහ් වහ්දහූ" (අල්ලාහ්ගේ අභිමතය පරිදි පමණක්) යන නියම ප්රකාශය වෙත එතුමාණෝ මඟ පෙන්වූහ. එහිදී අල්ලාහ්ගේ අභිමතය වෙන් කළේය. සම්බන්ධ කරන කවර වර්ගයක පදයකින් හෝ එම අභිමතය සම්බන්ධ කළේ නැත.

http://www.sunnah.global/hadeeth/si/show/5928